# 2012 නොවැම්බර් මස 06 වෙනි දින
# නැගෙනහිර දෙවැනි පළාත් සභාව අමතා
# නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරවර
# රියර් අද්මිරාල් මොහාන් විජේවික්‍රම මැතිතුමාගේ
# පවත්වන ප්‍රධාන දේශනය

නැගෙනහිර පළාත් සභාව
ත්‍රිකුණාමලය.

# 2012 නොවැම්බර් මස 06 වෙනි දින
# නැගෙනහිර දෙවැනි පළාත් සභාව අමතා
# නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරවර
# රියර් අද්මිරාල් මොහාන් විජේවික්‍රම මැතිතුමා
# පවත්වන ප්‍රධාන දේශනය

නැගෙනහිර පළාත් සභාව
ත්‍රිකුණාමලය.

ගරු සභාපතිතුමියනි,
ගරු ප්‍රධාන අමාත්‍යතුමනි,
ගරු අමාත්‍යවරුනි,
ගරු පළාත් සභා මන්ත්‍රීවරුනි,
නෝනාවරුනි, මහත්වරුනි,

නැගෙනහිර පළාත් දෙවැනි සභාවේ මංගල සැසිවාරය ආරම්භ කරමින් එහි සමාරම්භක දේශනය පැවැත්වීමට ලද මෙම අවස්ථාව මා ලද භාග්‍යයක් කොට සලකමි.

සාම්ප්‍රදායිකව මාගේ දේශනය පළමු සැසිවාරයේදී කිරීමට තිබුණත් අතිගරු ජනාධිපතිතුමා විසින් පළාත් සභාවේ අදහස් විමසන ලද දිවිනැගුම පනත් කෙටුම්පත සඳහා කඩිනමින් පළාත් සභාවේ අදහස් ලබා ගැනීම අවශ්‍ය වූ බැවින් අද දිනට මෙම මංගල සැසිවාරය යොදා ගැනීමට සිදුවිණි. අද දින මෙම කර්තව්‍ය සඳහා පළාත් සභාව රැස්කිරීම සම්බන්ධයෙන් මම ගරු සභාපතිතුමියට මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙමි.

නැගෙනහිර පළාත් සභාවට ජනතා නියෝජිතයන් ලෙස තේරී පත් වූ ඔබ සැමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ එතුමාගේ රජය වෙනුවෙන් මා පළමුව මාගේ සුභාශිංසනය පුද කරන්නට කැමැත්තෙමි.

ශ්‍රී ලංකා දේශපාලනයේ නව මංසලකුණක් සනිටුහන් කරන මෙම අවස්ථාව ඔබට මෙන්ම නැගෙනහිර පළාතේ ජනතාවටද ඓතිහාසික හා සුවිශේෂී අවස්ථාවක් වන බව මාගේ හැඟීමයි. වසර තිහකට ආසන්න කාලයක් කුරිරු ත්‍රස්තවාදයට යට වී අවි බලයට තම ප්‍රජාතාන්ත්‍රවාදී අයිතීන් අහිමිව යුද්ධයෙන් බැට කෑ ජනතාව මේ වන විට නිදහස හා සාමය අත්විඳිමින් සිටිති. බොහෝ සිත් සතන් තුළින් යුද්ධයේ බිහිසුණු බව, කෲරත්වය අමතකව යමින් පවතින මේ අවස්ථාවේ, නැවත නැවතත් එම අඳුරු අතීතය ඔබට අනුස්මරණය කිරීමට මා අකමැත්තෙමි. නමුදු ඔබ අද අත් විඳින මේ නිදහසේ නියමුවා වන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා හා ඒ වෙනුවෙන් උර දුන් වීරෝදාර රණවිරුවන් මෙම සුවිශේෂී අවස්ථාවේ සිහිපත් කිරීම මාගේ යුතුකමකි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ වීරෝදාර නායකත්වයෙන් හා රණවිරුවන්ගේ අපරිමිත කැප කිරීම් නොවන්නට මෙම මහඟු අවස්ථාව උදා නොවන්නට ඉඩ තිබුණි. එදා නැගෙනහිර පළාතේ මාවිල් ආරුවෙන් දියත් කළ මානුෂික මෙහෙයුම උතුරු පළාතේ වෙල්ල මුල්ලිවෙක්කාල් කලපුවෙන් අවසන් වුයේ මුළු මහත් ශ්‍රී ලංකා භූමි තලයටම සාමයේ අරුනලු උදා කරමිනි.

දිගු කාලයක් මුළුල්ලේ බියෙන් හා සැකයෙන් කල් ගෙවූ මෙහි ජනතාව අද වන විට කිසිදු බාහිර බලවේගයකට යට නොවී නිදහසේ තම රැකියා හා ව්‍යාපාරවල නිරතව සිටිති.

2008 ජුනි මස 11 වන දින නැගෙනහිර පළාත් සභාවේ පළමුවන සැසිවාරය ආරම්භ කිරීම සඳහා මම පැමිණි අවස්ථාවේදී උතුරු ප්‍රදේශය නිදහස් කර ගැනීම සඳහා මානුෂික මෙහෙයුම ක්‍රියාත්මක වෙමින් පැවතුන අතර, ඒ අවස්ථාවේ දිනා ගත් නැගෙනහිර නිදහස, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ජනතාව වෙත කඩිනමින් ලබා දෙන ලදි.

පසුගිය කාලයේ අප පළාත තුළ ක්‍රියාත්මක වූ මුර කපොළු හෝ මාර්ග බාධක කිසිවක් අද දැකිය නොහැක. අවිගත් කණ්ඩායම් හි නියෝග මත එදා පළාත් සභා මැතිවරණවලට ඉදිරිපත් නොවූ විවිධ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් අද දිනයේ කිසිවකුගේත් බලපෑමට යට නොවී මැතිවරණ සඳහා ඉදිරිපත් වීම තුළින් පෙනී යන්නේ පළාතේ ජනතාවට පූර්ණ නිදහසත්, ප්‍රජාතන්ත්‍රවාදයත් ලැබී ඇති බවයි.

දැන් අවිගත් සංවිධාන විසින් ත්‍රස්ත කටයුතු සඳහා දරුවන් පැහැර ගෙන යන්නේ නැත. ඔබ ඉතා දුක් මහන්සි වී හරි හම්බ කරන දෑ කප්පම් ලෙස හෝ වෙනත් ආකාරයෙන් කිසිවෙකුටත් ලබා දිය යුතු නැත. තරුණයන් අතුරුදහන් වන්නේද නැත. ඇතැම් පිරිස් පිළිගැනීමට මැලි වුනද සැබෑ තත්වය මෙයයි.

**භූගෝලීය තොරතුරු**

ගරු සභාපතිතුමියනි,

නැගෙනහිර පළාත ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ පිහිටා ඇති අතර එය උතුරින් උතුරු පළාතටද, නැගෙනහිරින් බෙංගාල බොක්කටද, බටහිරින් උතුරු මැද පළාතට, නිරිත දිශාවෙන් මධ්‍යම පළාතටද, දකුණින් ඌව පළාතට හා දකුණු පළාතටද මායිම්ව පිහිටා තිබේ. නැගෙනහිර පළාතේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 9,792 ක් වන අතර, එය ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 16% කි. වර්ග කිලෝමීටර් 390ක ප්‍රමාණයක් අභ්‍යන්තර ජලාශවලින් සමන්විතය. නැගෙනහිර පළාත දර්ශනීය දිගු වෙරළ තීරයකින්, අභ්‍යන්තර ජලාශ, මිශ්‍ර වනාන්තර හා කෘෂිකර්මාන්තයට ඔබින සාරවත් භූමියකින් සමන්විත වන අතර, ජාත්‍යන්තර වටිනාකමකින් යුක්ත ත්‍රිකුණාමලය වරාය නැගෙනහිර පළාතට අනෙකුත් පළාත් වලට වඩා සුවිශේෂිතාවයක් එක් කිරීමට දායක වී ඇත.

**ජනගහනය**

2012 වසරේදී සිදු කරන ලද ජන සංගණනයට අනුව නැගෙනහිර පළාතේ මුළු ජනගහනය 1,547,377 කි. එය ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 7.6% කි. සිංහල, දෙමළ, මුස්ලිම් යන ජාතීන් බොහෝ දුරට සම සමව ජීවත් වන නැගෙනහිර පළාත ජනවාර්ගික සම්මිශ්‍රණයට කදිම නිදසුනකි.

**පරිපාලනය**

නැගෙනහිර පළාතේ ජීවත් වන ජනතාවට මහජන සේවාවන් සැලසීම සඳහා පළාත් සභාව අමාත්‍යාංශ පහකින් සමන්විතවන අතර, ඊට දෙපාර්තමේන්තු 20 ක් ඇතුළත්ය. ප්‍රධාන ලේකම් යටතේ ක්‍රියාත්මක වන ආයතන 13 කින් යුක්ත පරිපාලන සංවිධානයක් අප සතුව ඇති අතර, පළාත් රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, මාරු කිරීම හා විනය කටයුතු ආණ්ඩුකාරවරයා විසින්, පළාත් රාජ්‍ය සේවා කොමිසම මගින් සිදු කරනු ලැබේ.

නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන පරිපාලන දිස්ත්‍රික්ක තුනකින් සමන්විත වන අතර ඒ තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 45 කි. සමස්ත ග්‍රාම නිලධාරි කොට්ඨාශ 1,087 කි. ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අදාල දිස්ත්‍රික්කයේ, හඳුනාගත් සංවර්ධන කටයුතු මෙහෙයවනු ලැබේ. අදාල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ඒ ඒ දිස්ත්‍රික්කයන්හි සංවර්ධන හා පරිපාලන කටයුතු මෙහෙයවීමට විශාල පිටිවහලක් වී ඇත.

**නැගෙනහිර පළාත් සභාව ස්ථාපිත කිරීම**

උතුරු නැගෙනහිර පළාතේ අවිගත් පිරිසක් විසින් ක්‍රියාත්මක කෙරෙණු ත්‍රස්තවාදී ක්‍රියා අවසන් කිරීම සඳහා මූලික දේශපාලන විසඳුමක් ලෙස හඳුන්වා දුන් පළාත් සභා ක්‍රමය මත බිහි වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වසර 02 ක් වැනි කෙටි කාලයක් ක්‍රියාත්මක වීමෙන් පසුව 1991 වසරේදී විසුරුවා හරින ලදී.

අතීතයේ සිටම ශිෂ්ට සම්පන්න ජීවන රටාවකට උරුමකම් කියන ශ්‍රී ලාංකීය ජනතාව සාමකාමීව නිදහස දිනාගත් දා සිටම මනාව සංවිධානය වු ව්‍යවස්ථා පරිපාලන ක්‍රමයක් මගින් ජාතික, පළාත් හා ප්‍රාදේශීය පාලනය සිදු කර ඇත. එහෙත් පසුව නිර්මාණය වු උතුරු නැගෙනහිර ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ඇති වු අයහපත් වාතාවරණය මත වසර 17ක් පමණ මෙම පළාත් සභාව සඳහා මැතිවරණයක් පැවැත්වීමට නොහැකිවීම හේතුවෙන් අනෙකුත් පළාත් වලට සාපේක්ෂව මෙම පළාතේ ජනතාවට සංවර්ධනයේ ඵල නෙළා ගැනිමට නොහැකි විය. 2006 ඔක්තෝම්බර් 16 වැනි දින ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මත උතුරු සහ නැගෙනහිර වෙන් වෙන් පරිපාලන ඒකක වශයෙන් බෙදා වෙන් කරන ලද අතර, 2007 ජනවාරි මස පළමුවන දින සිට නැගෙනහිර පළාතට වෙනම ආණ්ඩුකාරවරයකු, කාර්යය මණ්ඩලය, සහ අවශ්‍ය යටිතල පහසුකම් සලසා ස්වාධීනව ක්‍රියාත්මක වීම ආරම්භ විය. 2008 මැයි මස 10 දින පැවති පළමු නැගෙනහිර පළාත් සභා මැතිවරණයෙන් තේරිපත්වූ පළමු සභාව 2008 ජුනි 11 වන දින සිට 2012 ජුලි 27 වැනි දින දක්වා නැගෙනහිර ජනතාවට විශාල පිටිවහලක් විය.

අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පරිපාලනය විමධ්‍යගත කිරීමේදී, පළාත් සභා විසින් ව්‍යවස්ථාදායක, විධායක සහ මූල්‍ය අධිකාරිය ක්‍රියාත්මක කල යුතු ක්ෂේත්‍ර පැහැදිලිව දක්වා ඇත. එසේම පළාත් සභාවල සහ මධ්‍යම රජයේ වගකීම්, විෂය ක්ෂේත්‍රයන් වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. තවද පළාත් සභා සහ මධ්‍යම රජය එකඟතාවයකින් කටයුතු කළ යුතු විෂයන් සමගාමී ලැයිස්තුවකට ඇතුලත් කොට ඇත.

යුද්ධය හේතුවෙන් එතෙක් කලක් සංවර්ධනය යථාර්ථයක් නොවූ නැගෙනහිර පළාත මේ වන විට යෝධ සංවර්ධන ක්‍රියාදාමයකට අවතීර්ණව ඇති බව මා පුන පුනා කිව යුතු නැත. නැගෙනහිර පළාත යුද්ධයෙන් මුදා ගැනීමෙන් අනතුරුව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මැතිතුමාගේ සංකල්පයකට අනුව දියත් වු 'නැගෙනහිර නවෝදය' වැඩසටහන මගින් අප පළාත ඉතිහාස ගත සංවර්ධනයකට පාත්‍රව ඇති බව රහසක් නොවේ. අම්පාර පානම සිට ත්‍රිකුණාමලයේ තෙන්නමරන්වාඩි දක්වා දිවෙන නැගෙනහිර පළාත ඉකුත් පළාත් සභා කාලය අවසන් කෙරෙන විට ඉතිහාසයේ පෙර නොවු විරූ තරමේ සීඝ්‍ර සංවර්ධනයක් උරුම කර ගෙන තිබේ.

නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති වු ඩී.එස්. සේනානායක මැතිතුමාගේ සිට හිටපු ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලය දක්වා වු වසර 55 ක පමණ කාල පාරසය තුළ නැගෙනහිර පළාතේ සංවර්ධනය සඳහා වෙන් කළ මුදලට වඩා වැඩි ප්‍රමාණයක් ඉකුත් 2008 වසරේ සිට 2011 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ සංවර්ධනය උදෙසා වෙන් කර ඇති බව මා ප්‍රකාශ කර සිටින්නේ ඉතාමත් සතුටිනි. 2008 වසරේ සිට 2011 දක්වා පමණක් රුපියල් මිලියන 53,000ක් නැගෙනහිර පළාතේ සංවර්ධනය වෙනුවෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මැතිතුමා ප්‍රමුඛ රජය විසින් වෙන් කර තිබේ.

ගරු සභාපතිතුමියනි,

ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ලෙස 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මෙරට ස්ථාපිත කළ පළාත් සභා ක්‍රමය දිවයිනේ අනෙකුත් පළාත් කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වුනද, නැගෙනහිර පළාත තුළ එය නියමාකාරයෙන් ක්‍රියාත්මක වුයේ ඉකුත් පළාත් සභාව ස්ථාපිත කිරීමෙන් පසුව බව අතිශයෝක්තියක් නොවේ. පළාත් සභා ක්‍රමය තුළ නොදරුවකු වු නැගෙනහිර පළාත් සභාව මේ වන විට අනෙකුත් පළාත් සමඟ සංසන්දනය කිරීමේදී ඉතා ඉහළ ප්‍රගතියක් උරුම කර ගෙන සිටින බව සඳහන් කළ යුතුයි. නැගෙනහිර පළාත මේ වන විට ආර්ථික, සමාජීය හා සංස්කෘතිමය අතින් ඉතා ඉහළ සංවර්ධනයක් අත්පත් කර ගෙන සිටින බව ඉතාමත් සතුටින් ප්‍රකාශ කරමි. එය වැඩිදුරටත් ඵලදායි හා ඉහළ උපයෝගීතාවයකින් ඉදිරියට ගෙන යාමට උරදීම ඔබ සැමගේ යුතුකමක් බව විශ්වාස කරමි.

එදා අම්පාර සිට ත්‍රිකුණාමලය කරා පැමිණීමට පැය දහයකට වැඩි කාලයක් ගත වුවද, යුද්ධය නිමාවීමෙන් පසු දියත් වු යෝධ සංවර්ධන ක්‍රියාදාමය තුළින් එම තත්වය මුළුමනින්ම වෙනස් වී ඇත. වර්තමානයේ නැගෙනහිර පළාත තුළ පුළුල් මාර්ග සංවර්ධනයක් හා යටිතල පහසුකම් සංවර්ධනයක් ක්‍රියාත්මක වේ. පළාත තුළ මහා පරිමාණ සංවර්ධන යෝජනාවලියක් ක්‍රියාත්මක කිරීම මේ වන විටත් රජය ආරම්භ කර ඇති අතර, දිස්ත්‍රික්ක ත්‍රිත්වය තුළ නාගරික සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම, සංචාරක කලාපයක් ඇති කිරීම සහ අංග සම්පූර්ණ මාර්ග පද්ධතියක් ඉදි කිරීම ඉන් කිහිපයකි.

යුද්ධය හේතුවෙන් අඩපණව තිබු නැගෙනහිර පළාතේ සංචාරක කර්මාන්තය මේ වන විට නව පණක් ලබා ඇති අතර, නැගෙනහිර වෙරළේ සුන්දරත්වය අත්විදිමට නන් දෙසින් පැමිණෙන විදෙස් සංචාරකයන්ගෙන් සමස්ත දිවයිනේම සංචාරක කර්මාන්තය ඉතා ඉහළ ප්‍රගතියක් අත්පත් කර ගෙන සිටී. දකුණේ පමණක් ඉදි වූ සුපිරි තරු පංතියේ හෝටල්, සංචාරක නිකේතන නැගෙනහිර පළාත තුළ ඉදිකිරීමට ආයෝජකයන් පෙළඹී සිටිති. යුද්ධය නිමාවීමෙන් පසු පසුගිය කාලය තුළ නැගෙනහිර පළාත තුළ සංචාරකයන්ගේ පැමිණීම 80% අගයකින් ඉහළ ගොස් ඇති අතර, ලොව වටා සංචාරය කරන සුපිරි සංචාරක මගී නෞකා පවා අද දිනයේ කිසිදු බියකින් සැකයකින් තොරව ත්‍රිකුණාමලය වරායට සේන්දු වෙති.

රටේ ආර්ථිකයට මහඟු පිටිවහලක් ලබා දෙන කෘෂි කර්මාන්තය හා ධීවර කර්මාන්තය අප පළාතේ ජනතාවගේ ප්‍රධාන ජීවන වෘත්තීන් වන අතර, එය පසුගිය කාලයේ මහත් පසුබෑමකට යටත් වී තිබු බව නොරහසකි. වසර ගණනාවක් මුළුල්ලේ තම හේන් කුඹුරුවලට, ගොවි බිම්වලට යෑමට නොහැකිව සිටි ජනතාවට අද දිනයේ තම කෘෂිකර්මාන්ත කටයුතු නිදහසේ කර ගෙන යෑමේ අවස්ථාව උදා වී තිබේ. ධීවර රැකියාව අරභයා ක්‍රියාත්මක වු සියලු බාධා තහංචි මේ වන විට ඉවත් කර ඇති අතර, ධීවරයන් නිදහසේ තම ධීවර කටයුතු පවත්වා ගෙන යති.

**ආර්ථික සංවර්ධනය**

ගරු සභාපතිතුමියනි,

යුද්ධය නිමා වී ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමත් සමඟ නැගෙනහිර පළාතට පැමිණෙන ආයෝජකයන්ගේ ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර, ලොව පිළිගත් බහු ජාතික සමාගම්, ආයතන නැගෙනහිර පළාත තුළ ආයෝජන අවස්ථාවන් දියත් කරමින් සිටිති. කප්පල්තුරෙයි ප්‍රදේශයේ ආරම්භ කළ කර්මාන්තපුරය තුළ මේ වන විට ආයතන රාශියක් තම කර්මාන්තශාලා ආරම්භ කර ඇති අතර, ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව කර්මාන්තශාලා

රාශියක් ඉදි කිරීමට පිඹුරුපත් සකස් වෙමින් පවතින බව ප්‍රකාශ කර සිටින්නේ ඉතාමත් සතුටිනි.

ආර්ථික සංවර්ධන අමාත්‍යංශය හරහා ක්‍රියාත්මක කෙරෙන මෙම යෝධ සංවර්ධන ක්‍රියාදාමයන් තුළින් පළාතේ ආර්ථිකය සවිමත් වනවා පමණක් නොව, ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන් විශාල පිරිසකට රැකියා අවස්ථාවන්ද හිමි කර දී ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

ඉන්දියානු රජය හා ශ්‍රී ලංකා රජය එක්ව ඉදි කිරීමට නියමිත සාම්පූර් තාප බලාගාරයේ කටයුතු මෙම වසරේ ආරම්භ කෙරෙන අතර, ඊට සමගාමීව සාම්පූර් ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් විශේෂ ආර්ථික කලාපයක් ඉදි කිරීම රජයේ සැළසුමයි. මේ තුළින් විවර කෙරෙන රැකියා අවස්ථා පළාතේ උග්‍ර රැකියා වියුක්තිය තුරන් කිරීමට මහත් පිටිවහලක් වන බව මාගේ හැඟීමයි. 2013 වසරේ "දැයට කිරුළ" ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය පැවැත්වීමට නැගෙනහිර පළාත තෝරා ගෙන ඇති අතර, ප්‍රදර්ශනය අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතන භූමියේදී පැවැත්වේ.

ඒ අනුව දැයට කිරුළ වැඩසටහන මඟින් පළාතේ දිස්ත්‍රික්ක ඒකාබද්ධ සංවර්ධනයකට ලක් කිරීමට ඉවහල්වන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අප පළාතේ ජනතාවට සංවර්ධන ප්‍රතිලාභ තවදුරටත් පුළුල්ව  බෙදීයනු ඇත. ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධන කමිටු මඟින් හඳුනාගෙන, දිස්ත්‍රික් සංවර්ධන කමිටු මඟින් නිර්දේශ කරන ලද ප්‍රමුඛ ව්‍යාපෘති 2012, 2013 වසර තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 3,579 ක් , මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා රුපියල් මිලියන 3,061 ක් සහ සහ අම්පාර දිස්ත්‍රික්කය සඳහා රුපියල් මිලියන 2,107 ක මුදලක් වෙන් කර ඇත. එම සංවර්ධන කටයුතු ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යංශය, අනෙකුත් අමාත්‍යංශ, පළාත් සභා හා ප්‍රාදේශීය සභා දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරීන් සහ අනෙකුත් සියළුම ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ ක්ෂේත්‍ර හා තාක්ෂණික නිලධාරීන් සම්බන්ධ කොට ගෙන මෙහෙයවනු ලැබේ.

චීනවරාය ගුවන් තොටුපොළ අභ්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස සංවර්ධනය කිරීම මේ වන විටත් ආරම්භ කර ඇති අතර, ඊට සමගාමීව අම්පාර හා මඩකලපුව ගුවන් තොටුපළවල්ද සංවර්ධනය කෙරෙනු ඇත. මෙම වැඩසටහන් මඟින් අප පළාත ඉදිරි වසර කිහිපය තුළ අති විශාල සංවර්ධන ක්‍රියාදාමයකට යොමු වන බව නොකිවමනාය. ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනට නැගෙනහිර පළාත සුවිශේෂී දායකත්වයක් ලබා දිය යුතු බව මාගේ අදහසයි.

2008 වසරේදී දළ දේශිය නිෂ්පාදිතය සඳහා නැගෙනහිර පළාත දැක්වූ දායකත්වය 5.6% කි. එය 2011 වසර වන විට 5.7% දක්වා ඉහල ගොස් ඇත. 2011 වසර වන විට නැගෙනහිර පළාතේ ඒක පුද්ගල ආදායම රු.236,920 කි.

**අධ්‍යාපනය**

ගරු සභාපතිතුමියනි,

පසුගිය යුද්ධය පැවති කාලයේ නැගෙනහිර පළාතේ බිඳ වැටී තිබූ අධ්‍යාපනය 2008 වසරේ සිට 2012 දක්වා කාලය තුළ විශාල ප්‍රගතියක් අත්පත් කර ගෙන සිටින බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. නැගෙනහිර පළාතේ අධ්‍යාපන තත්වය ඉහල තලයකට ගෙන ඒම තුළින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනේදී නැගෙනහිර පළාත එහි සුවිශේෂ පාර්ශවයක් බවට පත් කිරීම අපගේ අරමුණ විය යුතුයි. මෙම අරමුණ සාක්ෂාත් කිරීම අරමුණු කර ගනිමින්, 2008 වසරේ සිට 2011 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති සඳහා පමණක් වැය කළ මුදල රුපියල් මිලියන 1,051.9කි. එසේම 2012 වසර සඳහා රජය රුපියල් මිලියන 496.8ක් වෙන් කර තිබේ. ඒ අනුව 2008 වසරේ සිට 2012 වසර දක්වා කාලය තුළ රජය නැගෙනහිර පළාතේ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති සඳහා පමණක් රුපියල් මිලියන 1,548.7ක් වෙන් කර ඇත. මීට අමතරව භාණ්ඩාගාරය හරහා යුනිසෙෆ් ආයතනය සහ වෙනත් සංවිධාන අධ්‍යාපන සංවර්ධනය සඳහා විශාල මුදලක් වියදම් කර ඇත.

එසේම 2008 වසරේ සිට 2011 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ අධ්‍යාපන උන්නතිය උදෙසා පන්ති කාමර ගොඩනැගිලි ඉදි කිරීම් 114 ක් ද, ප්‍රාදේශීය ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘති 60ක්ද, පාසල් විද්‍යාගාර ඉදිකිරීම් 58 ක්ද, පුස්තකාල ඉදිකිරීම් 51 ක්ද, පරිගණක හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන 16ක්ද, ගුරු නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති 09 ක්ද, පාසල් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් 652 ක්ද, සෞන්දර්යය පංති කාමර 08 ක්ද, ක්‍රියාකාරකම් කාමර 04 ක්ද, බහු කාර්යය පහසුකම් ගොඩනැගිලි 25ක්ද, පරිගණක යන්ත්‍ර 467ක්ද ලබා දීම ද සිදු කර ඇත. ගුරු ගැටළුව නැගෙනහිර පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පවතින බරපතලම ගැටළුව බව මාගේ විශ්වාසයයි. එම තත්වය අවම කිරීම උදෙසා 2008 වසරේ සිට 2012 දක්වා කාලය තුළ නැගෙනහිර පළාත් සභාව විසින් සිදු කර ඇති කාර්ය භාරය ඉමහත්ය. නැගෙනහිර පළාතේ පවතින උග්‍ර ගුරු හිගය අවම කිරීමේ අරමුණින් හා සිසු දරුවන්ගේ අධ්‍යාපන තත්වය ඉහල තලයකට රැගෙන ඒමේ අරමුණින් 2008 වසරේ සිට 2012 දක්වා කාලය තුළ දමිළ මාධ්‍ය ගුරු පත්වීම් 3,111 හා සිංහල මාධ්‍ය ගුරු පත්වීම් 1,323 ක් ලබා දීමට කටයුතු කර තිබේ.

පළාතේ අධ්‍යාපන තත්වය ඉහලට ගෙන ඒම අපගේ එක් මූලික අරමුණක් බව මා මීට පෙරද සඳහන් කළෙමි. එහි එක් කාර්යයක් ලෙස 2008 වසරේ සිට 2012 දක්වා කාලය තුළ පාසල් 34ක් නැගෙනහිර පළාත තුළ අළුතින් ආරම්භ කර තිබේ. මෙම කාලය තුළ පාසල් 33ක් , 06 වසර සිට 09 වසර දක්වාද, පාසල් 51ක් 10 වසර සිට 11 වසර දක්වාද, පාසල් 56 ක් උසස් පෙළ දක්වාද උසස් කර ඇත.

මානව සම්පත් සංවර්ධනය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම රටක දිගු කාලීන ආයෝජනයකි. ඊට ලැබෙන ප්‍රතිලාභ මනා පෞරුෂයකින් හෙබි උගත්, බුද්ධිමත් පුරවැසියන් පිරිසක් රටට දායාද කිරීමයි. එම අරමුණ මුල්තැන්හිලා සමාජයේ යහ පැවැත්ම උදෙසා රජයේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිවලට සමගාමීව යමින් පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඵලදායී වැඩ කොටසක් ඉදිරි පස් වසර තුළ ඉටු කිරීම අපගේ ඉලක්කයයි.

නැගෙනහිර පළාතේ වෙසෙන පාසල් යන වයසේ පසුවන සෑම දරුවෙකුටම මූලික අධ්‍යාපන පහසුකම් ලබා දීම අත්‍යවශ්‍ය කටයුත්තක් සේ සලකා කටයුතු කරන අතර, පාසල් නොයන දරුවන් හඳුනාගෙන ඔවුන් පාසල් අධ්‍යාපනයට අනුගත කිරීම අපගේ මූලික වගකීමක් සේ සලකා කටයුතු කළ යුතුව ඇත. එසේම විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ට විශේෂ අධ්‍යාපන ඒකකයන්හි පුහුණුව ලබා දීමත්, නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් තුළින් විශේෂ අධ්‍යාපන අවස්ථා හා පුහුණු අවස්ථා ලබා දීමත් කළ යුතුව ඇත.

නැගෙනහිර පළාතේ දුෂ්කර පාසල් වල පවතින උග්‍ර ගුරු හිඟය අවම කිරීමත්, දෙවැනි බස සහ තොරතුරු තාක්ෂණ දැනුම වඩ වඩාත් පාසල් පද්ධතිය තුළ ප්‍රචලිත කිරීමත් අපගේ තවත් අරමුණකි. ඒ තුළින් අනාගත ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අදාල මානව සම්පත් පුහුණු කෙරෙනු ඇත.

**කෘෂිකර්මාන්තය**

ගරු සභාපතිතුමියනි,

නැගෙනහිර පළාත් ජනයාගෙන් 70% ක ගේ ප්‍රධාන ජීවන වෘත්තිය වන්නේ කෘෂි කර්මාන්තයයි. කලෙක "ශ්‍රී ලංකාවේ ධාන්‍යාගාරය" ලෙස විරුදාවලිය ලත් නැගෙනහිර පළාත ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයට ජාතික නිෂ්පාදනයෙන් 24% ක දායකත්වයක් සපයයි. එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම අපගේ අරමුණයි.

2006 වසර වන විට නැගෙනහිර පළාතේ කෘෂි කර්මාන්තය සඳහා යොදා ගත් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 197,552 වු අතර, වර්තමානයේ එයට අලුතින් හෙක්ටයාර් 65,200

ක් එක්ව ඇත. මේ හේතුවෙන් නැගෙනහිර පළාතේ වී අස්වැන්න මෙට්‍රික් ටොන් මිලියන 0.742 සිට මෙට්‍රික් ටොන් මිලියන 1.273 දක්වා වැඩි වී ඇත.

නැගෙනහිර පළාතේ කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා 0.93% ක දායකත්වයක් සපයන අතර, එය තවදුරටත් ඉහළට ගෙන ඒම අපගේ තවත් මූලික අරමුණක් විය යුතුය. එසේම පළාතේ වගා කටයුතු සඳහා යොදවා ගත හැකි බිම් ප්‍රමාණය ඉහළ දැමීම අපගේ තවත් අරමුණකි. උසස් බීජ වර්ග හඳුන්වා දෙමින්, වාරිමාර්ග සංවර්ධනය කරමින් හා ගොවියාට හොඳ වෙළඳ පොලක් හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා හොඳ මිලක් ලබා දීම ඉතා වැදගත් කොට සලකා අප විසින් කටයුතු සම්පාදනය කළ යුතුව ඇත. එසේම නව ලොවට ගැලපෙන කෘෂි තාක්‍ෂණික ක්‍රම උපායන් හරහා අපගේ ගොවි ජනයා සන්නද්ධ කිරීම අප ඉදිරියේ ඇති තවත් අභියෝගයකි.

කෘෂි කර්මාන්තයේ උන්නතිය උදෙසා රජය විසින් 2008 වසරේ සිට 2011 වසර දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් 834 ක් සංවර්ධනය කිරීමට කටයුතු කර ඇති අතර, ගොවි ජනතාව වෙනුවෙන් ලබා දෙන ගොවි සහනාධාරත්, යුද්ධය නිමා වීමත් සමග අඩපණව තිබූ කෘෂිකර්මාන්තය නගා සිටුවීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කරමින් සිටී. මේ හේතුවෙන් කෘෂිකාර්මික අංශයේ සියළු දර්ශක වල වර්ධනයක් දක්නට ඇති අතර, නැගෙනහිර නවෝදය යටතේ වී ගබඩා සංකීර්ණ, ග්‍රාමීය කෘෂිකාර්මික ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මිලියන 2,104 ක මුදලක් වැය කොට ඇත.

**ධීවර කර්මාන්තය**

නැගෙනහිර පළාත තුළ ධීවර කර්මාන්තයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. යුද්ධය පැවති කාලයේ ධීවර කර්මාන්තය අරභයා ක්‍රියාත්මක වූ විවිධ බාධක හා තහංචි සියල්ල මේ වන විට රජය විසින් ඉවත් කර තිබේ. බහුදින යාත්‍රා හා නවීන තාක්‍ෂණය යොදා ගැනීම තුළින් ධීවරයන්ගේ ආදායම් මාර්ග වැඩි වී ඇති අතර, නැගෙනහිර පළාතේ මත්ස්‍ය අස්වැන්නට විදේශීය වෙළඳ පොලේ ඉහල ඉල්ලුමක් ඇති බව නොරහසකි.

ශ්‍රී ලංකාවේ මුහුදු තීරයෙන් 23% නැගෙනහිර පළාතට අයත් වන අතර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ යෙදෙන වැව් ප්‍රමාණය 834ක් වේ. මෙයින් ගම්‍ය වන්නේ නැගෙනහිර පළාතේ මත්ස්‍ය නිෂ්පාදන දියුණු කිරීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් ඇති බවයි. 2006 වර්ෂයේ මෙට්‍රික් ටොන් 6,540 වූ නැගෙනහිර පළාත් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2011 වන විට මෙට්‍රික් ටොන් 10,670 දක්වා වර්ධනය වී ඇත. දිවයිනේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයට නැගෙනහිර පළාතෙන් ලැබෙන දායකත්වය 19% කි.

**පශු සම්පත් සංවර්ධනය**

නැගෙනහිර පළාත මුදා ගැනීමත් සමඟ පශු සම්පත් සංවර්ධනයේ විශාල පිබිදීමක් ඇති වී ඇත. නැගෙනහිර පළාතේ පශු සම්පත් සංවර්ධනය කඩිනම් කිරීම අවශ්‍යතාවයක් බවට පත්ව ඇති අතර, එමඟින් ග්‍රාමීය ජනතාවට ආර්ථික වාසි අත් කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. මහ බැංකු සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ සමස්ත ගව නිෂ්පාදනය සඳහා 30%ක හා කිරි නිෂ්පාදනය සඳහා 17%ක දායකත්වයක් සපයන්නේ නැගෙනහිර පළාතයි.

ත්‍රස්තවාදය පැවති කාලයේ කිරි අස්වැන්න එකතු කිරීමේ ජාලය පවත්වාගෙන යාමට බාධාවක් සිදු වුවා මෙන්ම උසස් තත්වයේ කිරිගවයින් නොමැතිකමින් පශු සම්පත් නිෂ්පාදනය අඩාල විය. පශු වෛද්‍ය සේවා දියුණු කිරීම තුළින් සහ පශු සම්පත් ලබා දීමෙන් සිදුකළ හැකි නිෂ්පාදනය වැඩි කිරීමේ හැකියාව නැගෙනහිර පළාත අවබෝධ කර ගෙන ඇති අතර ඉදිරි වසර 05 ඇතුළත කිරි නිෂ්පාදනය දෙගුණ කිරීම අපගේ අරමුණයි.

නැගෙනහිර නවෝදය සංවර්ධන වැඩසටහන යටතේ මෙම පළාතට රු.මිලියන 1,337 වියදමින් පශු වෛද්‍ය කාර්යාල 10 ක්, කිරි සැකසුම් මධ්‍යස්ථාන 09 ක්, කිරි ශීත කිරීමේ ඒකක 14 ක් සහ සතුන් අභිජනන මධ්‍යස්ථාන ඇති කිරීමටත් කටයුතු කර ඇත. සංඛ්‍යාලේඛන වලට අනුව නැගෙනහිර පළාතේ වාර්ෂික කිරි නිෂ්පාදනය දළ වශයෙන් කිරි ලීටර මිලියන 64.7ක් වන අතර එයින් 30% ක් කිරි සැකසුම් මධ්‍යස්ථාන වෙත යොමු කරයි. හොඳ කළමනාකරණ පුරුදු මඟින් අවම මිල යටතේ උසස් කිරි ගවයින් යොදා ගෙන කිරි නිෂ්පාදනය වැඩි කිරීම තුළින් කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම නැගෙනහිර පළාත් සභාවේ අරමුණ වේ.

යුද්ධය පැවති කාලයේදී මෙම කිරි ගවයින් සඳහා අවශ්‍ය තරම් තෘණ භූමි පැවතියද, යුද්ධය නිමා වීමත් සමඟ ඇති වු වගා සංග්‍රාමය හේතුවෙන් එම තෘණ භූමි අහිමි වී ඇත. ඒ හේතුවෙන් එම සතුන්ගේ ආහාර හිඟතාවයට පිළියමක් ලෙස කෘෂිකර්ම අමාත්‍යංශය ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික් තුනෙන් තෘණ භූමි ලෙස ඉඩම් ප්‍රමාණයක් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරන ලෙස පශු සම්පත් සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යංශය වෙත ඉල්ලීමක් කර ඇත.

**සෞඛ්‍ය**

ගරු සභාපතිතුමියනි,

අපගේ සෞඛ්‍ය සේවය සෑම අතින්ම ජාතික සෞඛ්‍ය නිර්ණායක මට්ටම දක්වා ඉහළ ගොස් ඇති අතර, මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් අනෙක් පළාත් අභිබවා ගොස් ඇත. එමෙන්ම සෞඛ්‍ය තොරතුරු පරිගණක ගත කිරීමේ ප්‍රමුඛයා බවටද නැගෙනහිර පළාත් සේවය පත්ව තිබේ.

සෑම පුද්ගලයෙකුටම ප්‍රමාණාත්මක හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් ලබා දීම, ජනතාවට අවම දුරකින්, අවම කාලයක් තුළ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හැකි වන සේ සෞඛ්‍ය සේවාවන් වැඩි දියුණු කිරීම සහ පවත්වා ගෙන යෑම පළාත් සෞඛ්‍ය සේවාවේ අරමුණයි. නැගෙනහිර පළාතේ භෞතික හා මූල්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස යොදා ගනිමින් රටේ වටිනාම සම්පත වූ නිරෝගී මානව සම්පත නැගෙනහිර පළාතේ සංවර්ධනයට දායක කරවීමට අදර්ශමත් වන පරිදි පළාත් සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යෑමට ඉදිරි කාලයේදී කටයුතු කරනු ඇත.

පසුගිය වසර 04 තුළදී යුදමය වාතාවරණය හේතුවෙන් වැසී ගිය රෝහල් 30ක් සියළු පහසුකම් සහිතව විවෘත කිරීමට හැකියාව ලැබුණි. තවද විශේෂඥ වෛද්‍යවරු, වෛද්‍යවරු, හෙද නිලධාරීන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් හා අතුරු වෛද්‍ය සේවයේ නිලධාරීන් සංඛ්‍යාව 913 සිට 1,081 දක්වා වැඩි කිරීමට හැකියාව ලැබුණි. තවද ප්‍රාදේශීය රෝහල් වශයෙන් තිබූ රෝහල් 07 ක් මූලික රෝහල් ලෙස උසස් කර සෑම පුද්ගලයකුටම ප්‍රමාණවත් හා ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ලබා දීමට හැකියාව ලැබී ඇත. රෝහල් සඳහා අවශ්‍ය ගිලන් රථ 23 ක්ද පසුගිය කාල සීමාව තුලදී බෙදා දීමට සමත් විය. එමඟින් නැගෙනහිර පළාතේ සෞඛ්‍ය පහසුකම් වර්ධනය වී ඇත.

මාතෘ හා ළමා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා නව සායන ඉදි කිරීම හා දැනට පවතින සායන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම අපගේ ඉදිරි සැලසුම් අතර වේ. දැනට ක්‍රියාත්මක මූලික හා ග්‍රාමීය රෝහල්වල පහසුකම් වැඩි දියුණු කිරීම ඉදිරි වසරවල් තුලදී සිදු කෙරෙනු ඇත. නැගෙනහිර පළාතේ දැනට ක්‍රියාත්මක ආයුර්වේද රෝහල් වැඩි දියුණු කිරීම තුළින් පාරම්පරික ජනතා උරුමයක් වූ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තවදුරටත් ආරක්ෂා වෙනු ඇත. ප්‍රජා වෛද්‍ය නිලධාරීන්ගේ සේවාවද වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ඇත.

**ක්‍රීඩා සංවර්ධනය**

මීට දශක කිහිපයකට පෙර නැගෙනහිර පළාත ක්‍රීඩා කෞශල්‍ය අතින් ඉතාමත් ඉහල තලයක පැවති අතර, වොලිබෝල්, පාපන්දු හා පැසි පන්දු යන ක්‍රීඩා ඉසව් වල ජාතික

ශූරතාවයන් වරින් වර හිමි කර ගැනීමට නැගෙනහිර පළාතට හැකි වූ බවට අතීත සාක්ෂි ඇත. නමුත් නැගෙනහිර පළාතේ තිබූ අස්ථාවර අනාරක්ෂිත තත්වයන් එම ජයග්‍රහණයන් අප අතරින් දුරස් කරවීමට සමත් විය. කෙසේ වෙතත් නැවත වරක් අප පළාත ජාතික ක්‍රීඩා තලය ආක්‍රමණය කරමින් සිටියි. පසුගිය වසර පහක් පුරා අඛණ්ඩව කබඩි පිරිමි ශූරතාවයේ ජාතික කිරුළ හිමි කර ගැනීමට අප පළාතට හැකි වී තිබේ.

එසේම ජාතික ක්‍රීඩා තරගාවලියේදී අප පළාත දිනා ගන්නා පදක්කම් ප්‍රමාණයේ ඉහළ යාමක් දැකිය හැක. 2007 වසරේදී අප පළාත පදක්කම් 04ක් දිනා ගනිද්දී, 2011 වසරේදී එම ප්‍රමාණය පදක්කම් 19 ක් දක්වා ඉහළ ගොස් ඇත.

2008 වසරේ සිට මේ දක්වා නැගෙනහිර පළාතේ ක්‍රීඩාංගන වැඩි දියුණු කිරීම හා එහි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් රුපියල් මිලියන 54ක් වැය කර තිබේ. ඉදිරියේදී ත්‍රිකුණාමලය මැක්හේෂියර් ක්‍රීඩාංගනය පළාත් ක්‍රීඩා සංකීර්ණයක් ලෙස සංවර්ධනය කෙරෙන අතර, මඩකලපුව වෙබර් ක්‍රීඩාංගනය හා අම්පාර නගර සභා ක්‍රීඩා පිටියද සියළු අංගෝපාංගවලින් සමන්විත වන පරිදි සංවර්ධනය කිරීමට රජය සැලසුම් කර තිබේ. එම ක්‍රීඩාංගන පරිශ්‍ර තුළ ජාත්‍යන්තර තලයට ඔබින අන්දමේ තණතිලි සහිත ක්‍රිකට් ක්‍රීඩාංගන මෙන්ම රගර්, පැසිපන්දු, පාපන්දු, වොලිබෝල් හා පිහිනුම් තටාකාංගනද, කායවර්ධන මධ්‍යස්ථානද ඉදි කිරීමට සැලසුම් වී තිබේ. අප පළාතේ ක්‍රිඩක ක්‍රීඩිකාවන්ට දිවයිනේ අනෙකුත් පළාත් වල ක්‍රිඩක ක්‍රීඩිකාවන් භුක්ති විඳින සුපිරි පහසුකම් ලබා දීම හා ඒ තුළින් ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍ය වැඩි දියුණු කිරීම රජයේ මූලික අරමුණයි.

වසරක් පාසා අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වෙන ජාතික නිදහස් දිනය ලබන වසරේදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිතව ඇති අතර ඊට සමගාමීව පැවැත්වෙන දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය අම්පාරේදී පැවැත්වේ. අප පළාත පසුගිය කාලයේ ලබා ඇති පුනර්ජීවය හා වැදගත්කම ඒ තුළින් මනාව පිළිබිඹු කෙරෙන බව මාගේ විශ්වාසයයි.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව අනුව කිසිදු පළාත් සභාවකට සිය අභිමතාර්ථයන් ඉටු කර ගැනීමට තනිව ගමන් කළ නොහැක. ඒ සඳහා නිරන්තරයෙන් මධ්‍යම රජයේ අනුග්‍රහය සහ උපකාරය ලබා ගත යුතුය. උදාහරණයක් වශයෙන් පළාත් සභා ක්‍රියාදාමයට වාර්ෂිකව රජයේ අයවැයෙන් මුදල් ලබා ගත යුතුය. බස්නාහිර පළාත් සභාව ඇතුළු අනිකුත් පළාත් සභාවලට තම කාර්යයන් සඳහා පළාතෙන් උපයාගන්නා මුදල ප්‍රමාණවත් නොවන බව අපි සියළු දෙනා දන්නා කරුණකි. එසේම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ සංඛ්‍යාව තීරණය කිරීම, මධ්‍යම රජය සතුය. සමගාමී විෂයයන් සඳහා

ප්‍රඥප්ති සැකසීමේදී මධ්‍යම රජය සමඟ අන්‍යෝන්‍ය අවබෝධයෙන් සහ සහභාගීත්වයෙන් කටයුතු කළ යුතුව ඇත.

පළාත් සභා ක්‍රමයේ පාලන ව්‍යුහය, පැවරුණ විෂයන් බලසීමාවන් ව්‍යවස්ථාව මගින් පැහැදිළිව දක්වා ඇත. මේවා නැගෙනහිර පළාත් සභාවේ ජනතා නියෝජිතයන් ලෙස පත් වූ ඔබ නිසි අයුරින් අධ්‍යයනය කොට අවබෝධ කර ගෙන පළාතේ මහජනතාවට වඩාත්ම කාර්යක්ෂම, සංවර්ධනයක් සහ සේවාවන් ලබා දීම ඔබ සැමගේ ප්‍රධාන කර්තව්‍යය වේ.

ශ්‍රී ලංකාවේ පළාත් අතුරින් නැගෙනහිර පළාතට හිමි වන්නේ, සුවිශේෂි ස්ථානයකි. නැගෙනහිර පළාත අප සියළු දෙනාට මහත් ආඩම්බරයකි. අනාදිමත් කාලයක සිට මෙම පළාත තුළ සිංහල, දමිළ සහ මුස්ලිම් ජනයා දැඩි මිත්‍රත්වයකින් හා සහයෝගීතාවයකින් ජීවත් වූ බව ඉතිහාසය සාක්ෂි දෙයි. පසු කලකදී අප අතර යම් යම් විරසකතාවයන් ඇති වුනද, ඒ සියල්ල අතීතයට එක් වී හමාරය. නැවත වරක් සියළු ජාතීන් සාමයෙන් හා සමගියෙන්, සහජීවනයෙන් කටයුතු කිරීම ආරම්භ කර තිබේ. සියවස් ගණනාවක් මුළුල්ලේ පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන බටහිර ජාතීන්ගේ බලපෑමට හසුව තිබූ නැගෙනහිර පළාත දීර්ඝ කාලීන යුද්ධයකින් මෙන්ම සුනාමි, සුළි සුළං හා ගංවතුර යන ස්වභාවික විපත් වලින්ද පීඩා විඳි පළාතකි. ඔබ කුමන ජාතියකට, කුමන ආගමකට, කුමන වර්ගයකට, කුමන දේශපාලන පක්ෂයකට උරුමකම් කීවද, ඔබ වචනයේ පරිසමාප්තයෙන්ම මහජන ඡන්දයෙන් පත් වූ ජනතා නියෝජිතයන්ය. ඔබගේ මූලික වගකීම මෙන්ම පරමාර්ථය විය යුත්තේ, නැගෙනහිර පළාතේ ජනතාවගේ සිතුම් පැතුම් හඳුනා ගෙන එම සිතුම් පැතුම් සපුරාලීමට කටයුතු කිරීමයි.

යුද්ධය නිමා වී ඇතත්, අප රට තවදුරටත් අස්ථාවර කිරීමට ඇතැම් රටවල් කටයුතු කරන බව නොරහසකි. ජනතා නියෝජිතයන් හැටියට ඔබ ඊට දායකත්වයක් නොසපයන බව මාගේ විශ්වාසයි. ජාතීන් අතර සමඟිය හා සාමදානය ඇති කිරීම හා නැගෙනහිර පළාත අනෙක් පළාත් හා සම මට්ටමකට ගෙන ඒමට ඔබ සියළු දෙනා අදිටන් කර ගත යුතු බව මාගේ විශ්වාසයයි. ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා යන ඓතිහාසික ගමනේදී නැගෙනහිර පළාත ඊට සුවිශේෂී දායකත්වය සැලසීම පක්ෂ විපක්ෂ සියළු දෙනාගේ කාර්යභාරය බව නැවත වරක් සිහිපත් කරමින්, ඔබ සියළු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මාගේ සමාරම්භක දේශනය අවසන් කරමි.